

"කොළඹ හදන්න නම් පක්ෂ ගෝත්‍ර ක්‍රමයෙන් ඈත් විය යුතුයි"

මිලින්ද මොරගොඩ
එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ පුරපති අපේක්ෂක

ඉදිරි පළාත් පාලන මැතිවරණයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ මහ නගර සභාව වෙනුවෙන් පුරපති අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කර ඇත්තේ හිටපු අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතාවය. මේ ඒ මහතා සමග 'රිවිර ඉරිදා සංග්‍රහය' කළ කතාබහකි.

ප්‍ර : රටේ වගකිව යුතු මැතිඇමතිකම් රැසක් හෙබ වූ ඔබ කොළඹ මහ නගර සභා මැතිවරණයේ දී සන්ධානයේ පුරපති අපේක්ෂකයා ලෙස තරග කරනවා. මේ තීරණය ගැනීමට බල පෑ කරුණු කාරණා මොනවද කියන සාම්ප්‍රදායික ප්‍රශ්නය මම ඔබෙන් මුලින්ම අහන්න කැමැතියි...

පි : මේ මොහොතේ දේශපාලනයට අවතීර්ණ වීමේ අදහසක් මට තිබුණේ නැහැ. විශේෂයෙන් ම මගේ ව්‍යාපාරික කටයුතු සහ ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක ලෙස කටයුතු කරමින් සිටි අවස්ථාවක ජනාධිපතිතුමාගෙන් මේ ආරාධනය මට ලැබුණා. එතුමාට ගරු කිරීමක් වශයෙන් මැතිවරණයට ඉදිරිපත් වීමට මම තීරණය කළා.

ප්‍ර : මේ තීරණය අභියෝගාත්මක එකක් ය කියලා ඔබ විශ්වාස කරන්නේ නැද්ද?

පි : මෙහෙමයි. මේ දක්වා මගේ ජීවිතයේ දී අභියෝග කියන දේවල් මට ලැබුණු අවස්ථා ලෙස සලකා මම කටයුතු කර තියෙනවා. ජයග්‍රහණය ලැබුණත් නැතත් ඒවායින් අපි පෝෂණය වෙනවා. අපේ චරිත හැදෙනවා. දේශපාලන හෝ ව්‍යාපාරික හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයකදී මම අභියෝග දිහා බලන්නේ ඒ විදිහටයි.

ප්‍ර : කොළඹ මහ නගරසභාව කියන්නේ හැමවිටම පාහේ එජාපයට ඓතිහාසික වාසියක් තිබෙන පළාත් පාලන ආයතනයක්. එවැනි තැනක ඔබට මෙවර යම් ප්‍රාතිහාර්යයක් එහෙමත් නැත්නම් වෙනසක් කළ හැකිය කියලා හිතෙනවද?

පි : මගේ දේශපාලනය පිළිබඳව එක එක්කෙනාට විවිධ මත තියෙන්න පුළුවන්. මගේ දේශපාලනය හැමවිටම ගමන් කරන්නේ පුරවැසියා කේන්ද්‍ර කර ගෙන මිසක් පක්ෂය මූලික කර ගෙන නොවෙයි. අපේ සමාජය පක්ෂ ගෝත්‍ර වශයෙන් වෙන් වෙන්ව සිටීම පිළිබඳ මට විවේචනයක් තියෙනවා. ඒ පැත්තෙන් බලන විට අලුත් සංකල්පයකට කොළඹ නගරයේ පරමාදර්ශයක් විය හැකියි. කොළඹ නගරය ගත්තොත් ඒ තුළ ජාතීන් රාශියක් ඉන්නවා. ඒ එක්කම සමාජ පසුබිම් රාශියක් තියෙනවා. පක්ෂ, ආගම්, පන්ති රාශියක් ක්‍රියාත්මක වෙනවා. නමුත් නගරයේ සමාජයක්, ආර්ථිකයක් හැටියට අනන්‍යතාවක් තියෙනවා. ඒ කියන්නේ හැමදෙනාම එකට වැඩ කරනවා. උදාහරණයක් විදිහට ඡන්ද කාලෙට පක්ෂ භේද වගේ දේවල් තිබුණට මැතිවරණයෙන් පස්සේ ඒවා අමතක වෙනවා. මම විශ්වාස කරන විදිහට ඒක වෙන තලයකට ගෙන යා හැකියි. පැහැදිලිවම මම මේ දෙස බලන්නේ දේශපාලනිකව නෙවෙයි.

ප්‍ර : නමුත් ඔබේ ඔය උනන්දුව යථාර්ථයක් කරගන්න වෙන්නේ පවතින ජනප්‍රියවාදී දේශපාලනය තුළයි. ඒ තුළ එජාපයට අගනගරයේ තියෙන ඓතිහාසික වාසිය අභියෝගයක් නොවෙයි ද?

පි : මම නැවත කියන්නේ අවස්ථාවක් ය කියලයි. විශේෂයෙන් ම දීර්ඝ කාලයක් පැවැති යුද්ධයෙන් අනතුරුව අලුත් සමාජයක් ගොඩනැඟීමේ බලවත් උත්සාහයක ජනාධිපතිතුමා නිරතව සිටිනවා. වසර 30 ක යුද්ධයෙන් අනතුරුව අපි මේ ඉන්නේ සංක්‍රාන්ති අවධියක. ඒ යුගයේ දී පරණ සංස්කෘතිය පරණ අදහස්ම ඉදිරියට ගෙන ගියොත් සාර්ථක වෙන්නේ නැහැ. අපේ ආරක්ෂක ලේකම්තුමා මේ වන විට නගරය තුළ විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. එය ඉදිරියට ගෙන යෑමට අවශ්‍යයි. ඒ එක්කම නගරයෙන් මුළු රටටම පණිවුඩයක් දෙන අදහසක් දර්ශනයක් ජනාධිපතිතුමාට තියෙනවා. මේ නගරය තුළ සියලු ජාතීන් කිසිදු ප්‍රශ්නයක් නැතුව එකට ජීවත් වෙනවා. එකට වැඩ කරනවා. ඒක හොඳ ඉදිරියට ගෙන යා යුතු පණිවුඩයක්. ඒ නිසා අර පරණ පවතින දේශපාලන රාමුව සදාකාලිකව ඉදිරියට යා යුතුය කියන දේ සාධාරණයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. අලුත් විදිහට හිතන්න අපි පටන් ගත යුතුයි.

ප්‍ර : පසුගිය මහ ඡන්දෙදි ඔබ ලැබූ පරාජයත් එක්ක ඔය යෝජනා කරන අලුත් දේශපාලන සංස්කෘතිය ප්‍රතික්ෂේප වීමක් සිද්ධ වුණාය කියලා කවරු හරි කිව්වොත් ඒ ගැන මොකද කියන්නේ ?

පි : ඔව් එහෙම කියන්න පුළුවන්. ඒක අසාධාරණ නැහැ. නමුත් මට ඒ පිළිබඳව තියෙන්නේ වෙන කියවීමක්. මෙහෙමයි දේශපාලන මට්ටමෙන් මට ඒ පණිවුඩය හරියට ඉදිරිපත් කරන්න බැරි වෙන්න ඇති. ජනතාව ඒ පිළිබඳ තීන්දුවක් දුන්නා. මම ඒකට ගරු කරනවා. මේ වතාවේ දී ඒ අත්දැකීම් සමග පණිවුඩයක් ඉදිරිපත් කිරීමට මම නැවත උනන්දු වෙනවා.

ප්‍ර : පුරපති අපේක්ෂකත්වය ඔබ භාරගත්තේ ජනාධිපතිවරයාගෙන් ලැබුණු ආරාධනාවක් මත කියලා ඔබ කිව්වා. ඔබ මේ සඳහා නම් කිරීම සම්බන්ධව සන්ධානයේ සෙසු හවුල්කාර පක්ෂවල ඒකමතික එකඟතාවක් තියෙනවා ද?

පි : සන්ධානයෙන් තමයි මාව නම් කරලා තියෙන්නේ. එහි නායකයා හැටියට ජනාධිපතිතුමා මට ආරාධනා කළා. මගේ නම ඉදිරිපත්ව ඇත්තේ ඒ විදිහටයි.

ප්‍ර : එම හවුල්කාර පක්ෂවල නායකයෝ එක්ක මේ පිළිබඳව ඔබ කතා කළා ද?

පි : මම සාකච්ඡා කිහිපයකට සහභාගි වුණා. සැමගේ පොදු එකඟතාවක් නොමැතිව මැතිවරණයට ඉදිරිපත් නොවන ස්ථාවරයක මම දිගටම හිටියා. පැහැදිලිවම මම මේක ඉල්ලලා කැන්වස් කරලා ගත්ත දෙයක් නෙවෙයි. මට මේක භාර දුන්න වගකීමක්. මගේ හැකියාවන් ශක්තීන් අනුව යමක් කළ හැකිය කියලා විශ්වාසය මට තියෙනවා.

ප්‍ර : කොළඹ ලංකාවේ වාණිජ අගනගරය වුණාට ජීවත්වීමට නුසුදුසු නගරයක මුද්‍රාව පසුගිය කාලේ ඊට වැදී තිබුණා. එතැනින් එහාට කොළඹ නගරය ගෙන යෑමට ඔබට තියෙන සැලසුම් මොනව ද?

පි : ඒ සම්බන්ධව කරුණු 10 කින් සමන්විත ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. එහිදී සෑම ක්ෂේත්‍රයක් පිළිබඳවම අවධානය යොමු කිරීමට අපි අපේක්ෂා කරනවා. මෙහෙමයි නිතරම අපි වතු ගැන කතා කරනවා. ඇත්තටම ඒ සංකල්පයත් වෙනස් විය යුතුයි. වතු කියන්නෙත් නගරය තුළ තියෙන ගමක්. එහි ආර්ථිකයක් තියෙනවා. වතුවලින් නගරයට සේවයක් සිදුවෙනවා. මේ දිනවල [illegible] ඒක කතා [illegible] කතා පැතිරෙනවා, නමුත් ඒක වෙන්නේ නැහැ. වතුවල ජනතාව අවිස්සාවේල්ලට අරගෙන ගියොත් ඒ ජනතාව නගරයට කරන සේවාව ලබාගන්න අපිට බැහැ.

ප්‍ර : ඔබ ඔහොම කිව්වට ආණ්ඩුව කරන්න යන්නේ ඒක නේද? විශේෂයෙන් ම විපක්ෂය මේ ගැන සමාජගත කරමින් ඉන්නේ ඊට වඩා වෙනස් කතාවක්

පි : නැහැ. එහෙම කරන්නෙ නැහැ. එතැනම, ඒ පළාතම අලුත් නිර්මාණයක් කිරීම ආණ්ඩුවේ දර්ශනයයි. මම කලිනුත් කිව්වා වගේ වතුවල ජීවත්වන ඒ ජනතාවගෙන් ආර්ථිකයට විශාල සේවයක් සිද්ධ වෙනවා. ආර්ථිකයේ කොටසක් ගලවමින් වෙන තැනකට දැම්මම ඒ ආර්ථිකය නිසි ලෙස ගලා යෑමක් සම්බන්ධ වීමක් සිදු වෙන්නේ නැහැ. මේ රට නගරය ගොඩනැඟීමට අවශ්‍ය නම් සටන්පාඨ දේශපාලනයෙන් දැන්වත් අපි ඉවත් විය යුතුයි. ඇත්තටම ඔය වතු කියන මානසිකත්වයෙන් අපි ඉවත් විය යුතුයි. ඒ වෙනුවෙන් ආකල්පමය, වෙනසක් සිදු විය යුතුයි. අනිත් අතට ඔය වතු තුළත් දේශපාලන වශයෙන් සම්පූර්ණයෙන් බෙදී තියෙනවා. එයින් ඈත් වී මේ සමාජය එකතු කළ යුතුයි. පක්ෂ භේදයකින් තොරව මේ සෑම වත්තකම සමාජ සමිති, පුරවැසි සමිති බිහිවිය යුතුය කියලා මම විශ්වාස කරනවා. වතුවල වැඩකටයුතු සිද්ධ විය යුත්තේ ඒවා හරහායි. මේ නගරය හදන්න නම් තද පක්ෂ ගෝත්‍ර ක්‍රමයෙන් අපි ඈත් විය යුතුයි.

ප්‍ර : පක්ෂ ගෝත්‍ර ක්‍රමයෙන් ඉවත් වීමේ සැබෑ අවශ්‍යතාවක් ඔබට තිබුණත් ඔබත් එක්ක ඔබේ කණ්ඩායමේ තරග කරන අනිත් උදවිය ඒකට ඉඩදෙයි ද?

පි : ඒ වෙනුවෙන් මම උනන්දුවෙනවා. ජනාධිපතිතුමා මාව මේ සඳහා පත් කළේ හේතුවක් ඇතුවයි. එතුමා මගේ අදහස් දන්නවා. මගේ දේශපාලනය දන්නවා. ඒ අදහස් නොගැළපෙනවාය කියලා විශ්වාස කළා නම් මාව මේ සඳහා තෝරා ගන්නේ නැහැ.

ප්‍ර : ඔබ හැමවිටම ලංකාවේ දේශපාලනය තුළ අලුත් අත්හදාබැලීම් සිදු කළ නිර්මාණශීලී දේශපාලනඥයෙක්. ඔබ මෙවර ඡන්ද ව්‍යාපාරය දියත් කරන්න බලාපොරොත්තු වෙන්නේ මොන විදිහටද?

පි : මෙහෙමයි. මීට පෙරත් කළා වගේ පෝස්ටර් කටවුට් මම ගහන්නේ නැහැ. මම පවත්වාගෙන ආපු ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ අරමුණක් මට නැහැ. ඒ එක්කම නගර සභා ඡන්දයක් කියන්නේ මහා ඡන්දයක් නෙවෙයි. මෙතැන සිද්ධ වෙන්නේ ලොකු ප්‍රතිපත්තිමය සාකච්ඡාවක් නෙවෙයි. මෙතැනදි කළ යුතු වන්නේ ප්‍රායෝගිකව නගරයට කළ හැකි දේ පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම හා ඒ පිළිබඳ විශ්වාසයක් ඇති කිරීමයි. අපේ දේශපාලන ක්‍රමය ගොඩනැගී ඇති ආකාරයට හැම කෙනාම ගිහින් පොරොන්දු ලබාදෙනවා. බිම් මට්ටමේ විශ්වාසයක් සඳහා ක්‍රමවත් පැහැදිලි වැඩ පිළිවෙළක් අපි ඉදිරි දිනවල දී ඉදිරිපත් කරනවා. ඇත්තටම නගර සභා දේශපාලනය කියන්නේ සමාජ සේවයක්. නගර සභිකයා කියන දේ වුණත් මුලින් නිර්මාණය වී තියෙන්නේ වෘත්තියක් හැටියට නෙවෙයි. වෙන රැකියාවක් කරන ගමන් වුණත් මේක කරන්න පුළුවන්. මෙවර අපේ ලැයිස්තුව නිර්මාණය කිරීමේ දී ඒ සඳහා අපි යම් උනන්දුවක් ගෙන තියෙනවා. ඇත්ත, ඒක එකපාරටම කරන්න බැහැ. ඒ සඳහා යම් කාලයක් ගතවේවි. එවැනි සංකල්ප මෙතැනට ගෙන ඒමට මම බලාපොරොත්තු වෙනවා. ඒ එක්කම පාලනයේ විනිවිදභාවක් පාරදෘශ්‍යතාවක් ගෙන ඒමටත් මම උනන්දුවක් දක්වනවා. ඒක සිදුවෙන්නේ පුරවැසියාගේ සහභාගිත්වය හරහායි. එවිට මෙතැන මොකක්ද වෙන්නේ කියලා පුරවැසියාට තේරෙනවා.

ප්‍ර : පෝස්ටර් කටවුට් භාවිත නොකිරීම පසුගිය මහ ඡන්දෙදි ඔබට අවාසි සහගත වුණා. එවැනි වටපිටාවක මේ ඡන්දෙදිත් එහෙමම කිරීම අවදානමක් නෙවෙයි ද?

පි : මෙහෙමයි. මම ඡන්ද තුනක් කරලා තියෙනවා. දෙකක වාසියක් වුණා. එකක අවාසියක් වුණා. හැම එකම දිනනවා නම් ඒක ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි. ජනතාව තීන්දුවක් දුන්නා. මම ඒකට ගරු කරනවා. ඒ පිළිබඳව කෑකෝ ගහන්න යන්නේ නැහැ. ඒ ගැන පසුවිපරමක් මම කරලා තියෙනවා. නමුත් ඉදිරි ගමනේදි සම්පූර්ණයෙන් මගේ දර්ශනය වෙනස් කර අවස්ථාවාදී ගමනක් යන්න මම ලෑහැස්ති නැහැ. ඒක මගේ ක්‍රමය නෙවෙයි.

ප්‍ර : මැතිවරණයේ දී ඔබේ තේමාව මොකක්ද?

පි : 'පරමාදර්ශී නගරයක්' කියන අදහස තේමාවක් ලෙසට ඉදිරිපත් කිරීමට අපි දැනට සාකච්ඡා කර තියෙනවා. ලබන සතියේ දී එය අපි ඉදිරිපත් කරනවා. ඇත්තටම කොළඹ කියන්නේ චූටි ශ්‍රී ලංකාවක්. ඒ වෙනුවෙන් අපි ඒ තේමාව ඉදිරිපත් කරනවා.

ප්‍ර : ඒ චූටි ලංකාවේ පළමු පුරවැසියා විය හැකිය කියලා ඔබට විශ්වාසයක් තියෙනව ද?

පි : ඒක තීන්දු තීරණය කළ යුත්තේ මම නෙවෙයි කොළඹ ජනතාවයි.

චාමර [illegible] කුමාර
chamara@rivira.lk

ප්‍ර- එජාප නායකත්වය සඳහා ඔබේ නම හිටිහැටියේ යෝජනා